එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: ohararm@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170811

**එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩල දූත පිරිස ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර සම්බන්ධතා ශක්තිමත් කරයි**

**අගෝස්තු 11 වැනිදා කොළඹදීය.** එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ද්විපාර්ශවික දූත පිරිසක් ශ්‍රී ලංකා රජයේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව හා එක්සත් ජනපදය අතර පවත්නා සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් අගොස්තු 08 වැනි බදාදා කොළමට පැමිණියහ. මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ කමිටුවේ සභාපති නිව් ජර්සි හි කොංග්‍රස් සභික රොඩ්නි ෆ්‍රීලින්ග්හියුසෙන් සහ ටෙක්සාස්හි කොන්ග්‍රස් සභික හෙන්රි බියුකර් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ, පාර්ලිමේන්තුවේ කථානායක ජයසූරිය සහ විපක්ෂනායක සම්බන්ධන් මහතා සමගින් අගෝස්තු 10 වැනිදා එලදායී සාකච්ඡාවන්හි නිරත වූහ.

මෙම කොංග්‍රස් මණ්ඩල සාමාජිකයින් මෙරටට පැමිණියේ එක්සත් ජනපද කොංග්‍රසය විසින් ශ්‍රී ලංකාවේ දේශපාලකින ප්‍රතිසංශෝධන හා ආර්ථික සංවර්ධනය වෙනුවෙන් අඛණ්ඩව සහාය ලබාදෙන අවස්ථාවකය. නව ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුතු ඉක්මන් කිරීමල සියලු ජාතීන්ට අයත් ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ශක්තිමත් කිරීමල ප්‍රතිසන්ධානය සහතික කිරීමල සහ ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම සංවර්ධනය කිරීමේ රජයේ ප්‍රයත්නයට එක්සත් ජනපදයේ පූර්ණ සහයෝගය ලබා දෙන බවට ඔවුන් පැවැත්වූ නිල සාකච්චා වලදී සහතික විය.

“මෙම සංචාරය මගින් ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර පවතින ශක්තිමත් ද්විපාර්ශවික සම්බන්ධතාවය විදහා දක්වනවා. එක්සත් ජනපද රජයේ ප්‍රධාන අංශ තුන මගින් ව්‍යාවස්ථා සංශෝධනය, සංහිඳියාව ඇතිකිරීම, සාධාරණත්වය සහ ආර්ථික සමෘද්ධිය ඇතිකරගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරණ උත්සාහයන්ට අඛණ්ඩව සහයෝගය දක්වනවා” යැයි ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති අතුල් කෙශාප් මහතා මෙහිදී පැවැසීය.

# # #